## අයගම ප්‍රාදේශිය සභාව

## රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 26 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 25 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, අයගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට අදාලව එකතු කල අගය මත බදු සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කල වටිනාකම රු. 578,037 පිළිබඳව ද කිසිඳු සටහනක් අදාල ලෙජර් ගිණුම තුල දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව උසාවි දඩ රු. 1,500,000 ක් ඇස්තමේන්තු කර ආදායමට ගිණුම් ගත කර තිබුණ ද ඉකුත් වර්ෂයට උසාවි දඩ තථ්‍ය ආදායම රු. 678,000 හා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා තථ්‍ය ආදායම රු. 332,417 ක් පමණ අඩු අගයක් ගෙන

තිබුණි. ඉකුත් වර්ෂයට අදාලව වැඩිපුර ගිණුම් ගත කරන ලද ආදායම රු. 822, 000 ජ' නල් සටහන් මඟින් සමුච්චිත අරමුදල් ගිණුමට ගලපා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මස අවසානයට හඳුනා ගෙන ඇති ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 3,251,530 ක් ද, ගිණුම අනුව ශේෂය රු. 182,526 ක්ද, වූ අතර, වෙනස රු. 3,069,004 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී රු. 4,888,540 ක් වූ ඇප තැන්පත් රු. 6,669,184 ක් ලෙස ගිණුම් ගත කර තිබූ බැවින් වෙනස රු. 3,596,453 ක් විය. සමාලෝචිත වර්ෂය තුල දී නිදහස් කරන ලද රු. 3,133,062 ක් වූ ඇප තැන්පත් රු. 4,829,226 ක් ලෙස ගිණුම් ගත කර තිබූ බැවින් වෙනස රු. 1,696,224 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබූ අත්තිකාරම් රු. 292,840 ක් වුවද ගිණුම් අනුව රු. 6,971,440 ක් වූයෙන් රු. 6,678,599 ක වෙනසක් නිරික්ෂණය විය.

(ඊ) දේශීය ණය සංවර්ධන අරමුදල මගින් අයගම වෙළඳ සංකීර්ණය ඉදි කිරිම වෙනුවෙන් 2012 පෙබරවාරි මස 01 දින ලැබී තිබූ රු. 1,860,000 ක් වගකීම ලෙස ගිණුම් ගත නොකර ප්‍රාග්ධන ආධාර අය ශීර්ෂය යටතේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(උ) පොදු වෙළඳ සංකිර්ණය දෙවන මහල 3 වන කඩ කාමරය හා පළමු මහල 2 වන කඩ කාමරය සඳහා වර්ෂයට අදාල ආදායම් රු. 704,667 ක් අත්තිකාරම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඌ) වටිනාකම රු. 7,145,230 ක් වූ සභාව සතු වාහන 05 ක් සහ යන්ත්‍ර සූත්‍ර 23 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 298,489 ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,402,257 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා / අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂ හා උප වැය විෂයයන් 28 කට අදාලව රු. 583,000 ක ප්‍රතිපාදනයන් කිසිදු වියදමක් නොදරා ඉතිරි වී තිබුණු අතර, වැය ශීර්ෂයන් 40 කට අදාලව රු. 3,775,626.13 ක ප්‍රතිපාදනයන් ඉතිරිව තිබුණි.

(ආ) 2000 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 25 කදි ලබා ගත් රු. 1,627,962 ක්වූ අත්තිකාරම් විගණන දිනය වූ 2012 නොවැම්බර් 14 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 ' | රු. 000 ' | රු. 000 ' |
| (i) වරිපනම් හා බදු | 370 | 430 | 140 |
| (ii) බදු කුලි | 2,025 | 1,900 | 125 |
| (iii) බලපත්‍ර ගාස්තු | 755 | 450 | 305 |
| (iv) වෙනත් ආදායම් | 5,627 | 4,057 | 1,571 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,010,416 |
| (ii) | මුද්දර ගස්තු | 3,251,530 |

2.3.3 මාළු කඩ බදු

අයගම සතිපොල අංක 1 මාළු කඩ කාමරය 2012 වර්ෂය සඳහා බදුගත් ටෙන්ඩර්කරු ජනවාරි සිට මාර්තු දක්වා මාස 03 ක් පමණක් කඩය පවත්වා ගෙන ගොස් තිබුණි. අදාල ටෙන්ඩරය අවලංගු කර ඊළගට වැඩිම ටෙන්ඩරය වූ රු. 126,260 ටෙන්ඩර්කරුට ටෙන්ඩර් ලබා නොදීම නිසා සභාවට රු. 63,130 ක ආදායමක් අහිමි වී තිබුණි.

2.3.4 වෙනත් ආදායම්

අයගම නගරයේ සන්නිවේදන පියස බදු මුදල් වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.42,761 ක මුදලක් අයවීමට තිබුණි.

2.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

යථෝක්ත වර්ෂයේ අයගම සති පොල අංක 01 මාළු කඩය, අයගම සතිපොල කුකුල් මස් කඩය හා අයගම නගරයේ මාළු ලැල්ල කිසිඳු ආදායමක් නොලබා වසා දමා තිබුණි.

2.5 මෙහෙයුම් අකර්යක්ෂමතා

(අ) සභාව සතු ඉඩම්, ගොඩනැගිලි ඇතුළු සියළු වත්කම් සම්බන්ධව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි

(ආ) අයගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 10 ක් සඳහා 2012 නොවැම්බර් 11 වන විට රු. 354,519 ක නඩත්තු පිරිවැයක් දරා තිබෙන අතර, 2012 නොවැම්බර් 11 දක්වා බිල්කල ආදායම රු. 108,100 ක් වූයෙන් ප්‍රවර්ථන වර්ෂය තුල රු. 246,419 ක අතිරේක පිරිවැයක් සභා අරමුදලින් දරා තිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම් කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) වත්කම් උපයෝජනය

(ඈ) ආදායම් පරිපාලනය